# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 මැයි මස 13 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.05.18 දින නිකුත් කරන ලදී)**


# ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**1986 අංක 28 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයන්ත කරුණාතිලක මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

### 1986 අංක 28 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව.**

1986 අංක 28 දරන පනත මගින් සංස්ථාපනය කරන ලද ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය ආයතනයේ භාරකාර මණ්ඩලය විසින් එකී භාරයේ නාමය සංශෝධනය කිරීම සඳහා යෝජනාවක් සම්මතකොට ගෙන ඇති හෙයින් ද:

එකී යෝජනාව ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එකී භාරයේ නාමය වෙනස් කිරීමට එකී ආයතනය විසින් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම ප්‍රඥාගෝචර වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 2021 අංක     දරන ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1986 අංක 28 දරන පනතට සිදු කරනු ලබන පොදු සංශෝධනය.**

**2.** ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ''ජාතික සංවර්ධන පදනම් භාරය'' යනුවෙන් ලුහුඬින් හෝ ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනතෙහි නැතහොත් ඒ පනත යටතේ නිකුත් කරන ලද යම් දැන්වීමක, හෝ වෙනත් ලේඛනයක, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, ''ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය'' යන යෙදුම වෙනුවට ''ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ 1 සහ දිස්ත්‍රික්ක 306 ඒ 2 ජාතික සංවර්ධන පදනම් භාරය'' යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

**ගිවිසුම් ආදිය සම්බන්ධයෙන් ආරක්ෂා සැලසීම.**

**3.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙර ''ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය'' විසින් හෝ එහි නමට හෝ සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ සෑම ගිවිසුමක්ම,

කොන්ත්‍රාත්තුවක් ම හෝ වෙනත් කවර වුව ද සාධන පත්‍රයක් නැතහොත් ලේඛනයක් ම මේ පනතේ ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයෙන් පසු "ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ 1 සහ දිස්ත්‍රික්ක 306 ඒ 2 ජාතික සංවර්ධන පදනම් භාරය" විසින් හෝ එකී නමට සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ එකක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.